2011.08.24 DIV KM

24 / 08 / 2011 - දිවයින

**කොළඹ එ.ජ.නි.ස. නගරාධිපති අපේක්ෂක මිලින්ද මොරගොඩ**

කොළඹ මහ නගර සභාව සඳහා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නගරාධිපති අපේක්ෂකයා ලෙස හිටපු ඇමැතිවරයකු වන මිලින්ද මොරගොඩ මහතා ඉදිරිපත් කිරීමට එක්සත් ජනතා නිදහස් සන්ධානය තීරණය කර ඇත.

එම සන්ධානයේ පක්ෂ නායකයන් ඊයේ 21 වැනිදා රැස්වූ අවස්ථාවේදී මෙම තීරණය ගෙන තිබේ.

කොළඹ නගර සභාව සඳහා නගරාධිපති අපේක්ෂකයා නම් කළද අනෙකුත් පළාත් ආයතන 22 සඳහා ප්‍රධානීන් නම් නොකොට විවෘතව තැබීමට ද සන්ධානය තීරණය කර ඇත.

මුස්ලිම් කොංග්‍රසය එ.ජ.නි.සයෙන් බොහෝ ආයතන සඳහා එක්ව තරග කරන අතර ආයතන කිහිපයකට පමණක් තනිව තරග කරනු ඇතැයිද දැනගන්නට තිබේ.